කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්
සමාජීය විද්‍යා පීඨය

# ආර්ථික විද්‍යාව - ECON - E 3015

## සාර්ව ආර්ථික විද්‍යාව

කැමති ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. තුලිත ආර්ථික ආකෘතියේ ප්‍රධාන ගති ලක්ෂණ පැහැදිලි කරන්න. එම ආකෘතිය සාර්ව ආර්ථික සමතුලිත විශ්ලේෂණය සඳහා භාවිත කෙරෙනුයේ කෙසේදැයි විස්තර කරන්න. නූතන අර්ථක්‍රමවලට එහි අදාළත්වය පිළිබඳව තිරසාර සංවර්ධන දෘෂ්ඨියකින් සාකච්ඡා කරන්න.

02. (අ) හරස්කඩ දත්ත හා කාල ශ්‍රේණි දත්ත අතර පවත්නා ප්‍රධාන වෙනස්කම් මොනවාද? කෙටි කාලීන හා දිගු කාලීන පරිභෝජන ශ්‍රිත ඇස්තමේන්තු කිරීම සඳහා එකී දත්ත භාවිත කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

(ආ) කේන්සියානු පරිභෝජන න්‍යාය විවේචනාත්මකව පරික්ෂා කරන්න. (ලකුණු 08)

03. (අ) 'IS - LM ආකෘතිය අර්ථ ක්‍රමයක විරැකියාව සහ උද්ධමනය පාලනය කිරීමේ දී භාවිත කළ හැකි ප්‍රයෝජනවත් උපකරණයකි.' පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) අර්ථ ක්‍රමයක සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම උදෙසා පිස්කල් ප්‍රතිපත්තියේ සහ මූල්‍ය ප්‍රතිපත්තියේ කාර්යයභාරය විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 10)

04. (අ) ආර්ථිකයක් ස්වයංක්‍රීයව හැඩගැසෙනවාය යන සම්භාව්‍ය මතය කේන්සියානුවන් විසින් ප්‍රතික්ෂේප කරනුයේ මන්දැයි පහදන්න. (ලකුණු 10)

(ආ) කේන්සියානු සේවා නියුක්ති න්‍යායේ පවත්නා දුර්වලතා මොනවා ද? සබෑ ලෝකයේ නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

05. (අ) අර්ථක්‍රමයක රාජ්‍ය ණය සහ අයවැය හිඟය අතර පවත්නා සම්බන්ධතාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) ඇතැම් සංවර්ධනය වෙමින් පවත්නා රටවල රාජ්‍ය ණය සීග්‍රයෙන් වර්ධනය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. පරිමානයෙන් රටවල් වෙනස් වන විට ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්වල වාසි සහ අවාසි නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු )

07. (අ) ජාත්‍යන්තර වෙළඳාමේ දී සාපේක්ෂ වාසි සහ තරඟකාරී වාසි යනුවෙන් ඔබ අදහස් කෙරෙනුයේ කුමක්ද? පහදන්න. (ලකුණු 08)

(ආ) ස්ථාවර විනිමය අනුපාතයක් සහ නම්‍ය විනිමය අනුපාතයක් අතර පවත්නා වෙනස්කම් මොනවා ද? (ලකුණු 06)

(ඇ) නම්‍ය විනිමය අනුපාතයක වාසි සහ අවාසි පෙන්වා දෙන්න. (ලකුණු 06)

08. පහත දැක්වෙන **හතරක් (04)** පිළිබඳ සටහන් ලියන්න. (ලකුණු 05 බැගින්)

(අ) සේවා වියුක්තියේ ප්‍රභේද

(ආ) උද්ධමනයේ ආර්ථික පිරිවැය

(ඇ) කේන්සියානු විප්ලවය

(ඈ) ශුද්ධ ජාතික ආදායම

(ඉ) සමාහාර වෙළඳපොල

(ඊ) තුලන අයවැය ගුණකය

**********************